# සිංහලයාගේ සම්භවය ගැන අදහසක්

පසුගිය සතියේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන අංශයෙහි සුමේධ වීරවර්ධන මහතා විසින් ලියන ලද නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ගැන හැඳින්වීමක් යන පොත දොරට වැඩීම නිමිත්තෙන් ඒ විශ්වවිද්‍යාලයෙහි කලාගාරයෙහි පැවති සම්මන්ත්‍රණයකට සහභාගිවීමේ අවස්ථාව ලදිමි. ඒ පොතෙහි විස්තරවන්නේ මා විසින් නිර්මාණය කෙරුණු ඥානවිභායක් බැවින් කතුවරයා මා පිළිබඳ පෞද්ගලික තොරතුරු ද කෘතියට එක්කර තිබුණි. අපේ පරම්පරාව පිළිබඳව මා ද නොදැන සිටි කරුණු ද අඩංගු වූ ඒ විස්තර පළකිරීමට පෙර කතුවරයා ඒ සඳහා මගෙන් අවසර පැතී ය. ඒ තොරතුරු පළකිරීම එක් අතකින් ගත්කල මගේ ඇතැම් (මුග්ධ) විරුද්ධවාදීන්ට ආයුධ සැපයීමක් වියහැකි වුවත් තොරතුරු සැඟවීමට මට අවශ්‍ය නොවූ බැවින් කතුවරයාගේ ඉල්ලීමට මම එකඟ වීමි.

මා බලාපොරොත්තු වූවාට ද වඩා ඉක්මණින් මගේ සම්භවය සංවාදයට ලක්විණි. ඒ සංවාදයකට වඩා සිංහල බෞද්ධයකු නොවන බෞද්ධයකු වූ සෝමරත්න මහතාගේ රාගය කෙසේ වෙතත් ද්වේශය හා මෝහය ප්‍රකාශකෙරුණ අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය. ඒ මහතා කියා සිටියේ මා සිංහල නොවන බව ය. එයට හේතුව අපේ ආදි මුත්තකු වූ ඨකුර නමැත්තා දැනට සියවස් දහයකට පමණ ඉහත භාරතයෙන් මෙරටට සංක්‍රමණය වී තිබීම ය. ඒ මහතා සිංහලයකු ලෙස හඳුනාගන්නේ කවුරුන් දැයි විස්තර නො කරයි.. එසේ වුවත් ඒ  මහතාට අනුව විජය රජුගෙන් සහ ඔහු සමග පැමිණි හත්සීයයෙන් පැවත එන්නන් සිංහලයන් බව පැහැදිලි ය. අනෙක් අය භාරතයෙන් කෙදිනක පැමිණි අයගෙන් පැවතෙන්නෝ වුව ද සිංහලයෝ නො වෙති. ඒ මහතා එවැනි අර්ථදැක්වීමක් (නිර්වචනයක්) නො කළ ද ඔහු කියන්නේ කුමක් ද යන්න පැහැදිලි ය. කෙසේ වෙතත් ඔහු තමා සිංහල බව පිළිගනියි. එසේ නම් ඔහුගේ විස්තරයට අනුව ඔහු එක්කෝ විජය රජුගෙන් නැත්නම් ඒ සමග පැමිණි හත්සීයෙන් එක් අයකුගෙන් පැවතෙන්නෙකි, ඒ මහතා ඒ බව දැනගත්තේ කෙසේ ද යන්න අපට දැනගැනීමට සලස්වන්නේ නම් මැනවි.

මගේ සිංහලකම ගැන ප්‍රශ්න කළ එසේත් නැතහොත් මා සිංහලයකු නො වේ යැයි පැවසූ පළමු තැනැත්තා සෝමරත්න මහතා නො වෙයි. කලකට පෙර බීබීසී නම් ජඩමාධ්‍ය (එහි ඔය කියන අපක්ෂපාතභාවයක් නො මැත.) ආයතනයේ අගුපිලේ ඇති සංදේශය නම් සිංහල විරෝධී ප්‍රචාරක මාධ්‍යයේ ප්‍රධානියා යැයි කියන ප්‍රියත් නමැත්තෙක් ද මගේ සිංහල කම ගැන ප්‍රශ්න කෙළේ ය. මොවුන් නොදන්නවා වුව ද ඒ ප්‍රශ්නයට අප පිළිතුරු දී දැන් දශක දෙකකට ද ආසන්න ය. අඳබාලයන්ට පින්සිදුවන්නට බුද්ධිමතකු වී සිටින එහෙත් ජීවිතයේ කිසිම දිනක සංකල්පයක් ප්‍රවාදයක් නිර්මාණයකර නොමැති කාලෝ ෆොන්සේකා මහතා ද සිංහලයකු හඳුනාගන්නේ කෙසේ ද යන ප්‍රශ්නය නගා ඇත. ඔහු කියන්නේ බටහිර ජීව විද්‍යාවට අනුව සිංහලයකු හා ඉංගිරිසිකාරයකු අතර වෙනසක් නැති බව ය. දෙදෙනාම මනුෂ්‍යයෝ වෙති. දෙදෙනා වෙන්කර හඳුනාගැනීමට බටහිර ජීව වි්‍යාවේ නිර්ණායක නැත. එහෙත් කාලෝ ෆොන්සේකා මහතා තේරුම් නොගන්නා කරුණක් නම් සිංහලයකු හා ඉංගිරිසිකාරයකු අතර වෙනස බටහිර ජීව විද්‍යාවෙන් තේරුම්ගත නොහැකි බව ය. ඒ තේරුම් ගතහැකි වන්නේ සමාජයීය විද්‍යාවන්හි දී ය. එහෙත් සුවිශේෂය හා සාමාන්‍ය අතර ඇති සම්බන්ධය තේරුම්ගැනීමට නොහැකි ලැක්ලාව් වැනි ඇතැම් බටහිර සමාජ වි්‍යාඥයන්ට සමාජයක් හෝ ජාතියක් හෝ කිවහැකි භූතාර්ථයක් (එන්ටිටි) නැත. සමාජයක් නැත්නම් සමාජ විද්‍යාවක් හා සමාජ විද්‍යාඥයන් පවතින්නේ කෙසේ ද යන්න ඒ සමාජ විද්‍යාඥයන් ගෙන් ම අසා දැනගත යුතු ය.  මී හරකා හා එලහරකා අතර වෙනස බටහිර ජීව විද්‍යාවට අනුව තේරුම්ගත හැකි වුව ද බටහිර භෞතික විද්‍යාවට අනුව තේරුම්ගත නො හැකි ය. මී හරකා එළහරකාගෙන් වෙන්කිරගැනීමට බටහිර භෞතික විද්‍යාවේ නිර්ණායක නැත. බටහිර භෞතික විද්‍යාවට ගෝචර නොවූ නිසා ම එළහරකා හා මී හරකා අතර වෙනසක් නැතැයි කියන්නා මී හරකකු ද නැත්නම් එළහරකකු ද නැත්නම් හේතුවාදියකු ද වෙනත් අයකු ද යන්න තීරණය කිරීම කාලෝ ෆොන්සේකා මහතාට ම භාර කළ යුතු ය

යමකු සිංහලයකු වන්නේ ලේවලින් නොවන බව දැනගැනීමට බටහිර භෞතවේදය හැදෑරිය යුතු නො වේ. එහි දී බලපාන්නේ ප්‍රධාන වශයෙන් ම යමකුගේ සංස්කෘතිය ය. මෙරටට විවිධ රටවලින්, විශේෂයෙන් ම භාරතයෙන් පැමිණි අය පරම්පරාවකින් දෙකකින් පසුව සිංහල සංස්කෘතියට අවශෝෂණය වී සිංහලයන් වී ඇති බව විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වූ සෝමරත්න මහතා නො දැනීම පිළිබඳව අපට ඇත්තේ කණගාටුවකි. තිබ්බතයෙන් පැමිණ පැවිදි වී යැයි කියන මහින්ද හාමුදුරුවන්ට සිංහලයකු වීමට ගත වී ඇත්තේ අවුරුදු කිහිපයක් පමණක් බව ද

© Prof. Nalin De Silva

ඒ සමග කිව යුතු ය. මෙරට නොසිටි දෙමළ බෞද්ධයන් (දෙමල බෞද්ධයන් එක් අයකු දෙදෙනකු සිටීම මගින් සාමාන්‍යකරණයක් -සාධාරණීකරණයක් - කළ හැකි නො වේ) ගැන අද කතාකරන තවත් විශ්වවිද්‍යාලයීය මහාචාර්යවරයකු වූ සුනිල් ආරියරත්න මහතා එදා මහින්ද හිමියන් නාසි ඒජන්තයකු බවට හැඟවෙන ප්‍රකාශයක් එහිමියන්ගේ ප්‍රබන්ධ එකතුකර ලියූ පොතක සඳහන්කළ බව ද ඒ කරුණ කාලෝ ෆොන්සේකා මහතාගේ දැඩි අවධානයට යොමු වූ බව ද මතක් කළ යුතු ය. (ඒ පොත නිකුත්වීම සම්බන්ධයෙන් පැවති සම්මන්ත්‍රණයක ෆොන්සේකා මහතා ද මම ද කථිකයෝ වූයෙමු.) සුවිශේෂය හා සාමාන්‍යය අතර වෙනස දන්නා බැවින් මම තවදුරටත් විශ්වවිද්‍යාලයීය ආචාර්ය සමිති සම්මේලනයේ සභාපති ලෙස කටයුතු කරමි.

විජය රජුගෙන් පසුව සිංහලයන් ඇතිවීම පිළිබඳ මහාවංස ප්‍රකාශය අපට තේරුම් ගත හැකි ය. මහාවංසය ලියන සමයෙහි සිංහල ජාතිය බිහිකිරීමෙහි ලා මෙරට යක්‍ෂ ගෝත්‍රිකයන්ගෙන් වූ දායකත්වය ඔවුන්ට අහිමිකිරීමට මතයක් සැකසී තිබුණු බව පැහැදිලි ය. එය එකල අධිපතිවාදී මතය වී ඇති බැවින් මහාවංසයට ඒ ඇතුළත් වූ බව සිතාගැනීම අපහසු නො වෙයි. ඒ හේතුවෙන් අද සිංහලයන් මෙරට ආදිවාසීන් නොවන බවට මතයක් ඇතිකිරීමට බටහිරයන්ට හා ඔවුන්ගේ සපත්තු ලෙවකන රාජ්‍ය නොවන සංවිධානවල ඇතැම් උගතුන්ට හැකි වී තිබේ. ආදිවාසියා යන සංකල්පය ම බටහිර නිර්මාණයකි. ඒ ඇබ්ඔරිජින් යන්නෙහි සිංහල පරිවර්තනයකි. යුරෝපීයයන්, විශේෂයෙන් ම ඉංගිරිසින් ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, උතුරු ඇමරිකාව ආදී ප්‍රදේශවලට ගියවිට එහි එවකට ද ජීවත්වූ ගෝත්‍ර විය. ඉංගිරිසිහු ඒ ප්‍රදේශවල සිටි ඒ පිරිස් සමූලඝාතනය කිරීමට කළහැකි සෑම දෙයක් ම කළහ. ඔවුන් සමග මිශ්‍ර වී ජාතියක් ගොඩනැගීමේ අදහසක් ඉංගිරිසින්ට නො වී ය. ඉංගිරිසින්ගේ මානව අයිතිවාසිකම් සුරැකීමේ අපූරු ප්‍රතිපත්තිය හේතුකොටගෙන ඒ ගෝත්‍රිකයෝ මුළුමනින් ම මෙන් වඳවූහ. අද ආදිවාසීන් යැයි කියන්නේ ඝාතනයට ලක්නොවී ඉතිරි වූ ගෝත්‍රිකයන්ගෙන් පැවත එන්නවුන්ට ය. මෙරට වැද්දන්ට ඉංගිරිසින්ගේ ආදිවාසික සංකල්පය අදාළ නො වෙයි.

සිංහල යනු මෙරට ආදිවාසින් ලෙස සැලකිය හැකි යක්‍ෂ (ඇතැමුන්ට අනුව යක්‍ෂයන් ද පිටින් පැමිණ ඇත.) නාග, දේව ආදී ගෝතිකයන්ගේ සහ ක්‍රිස්තු පූර්ව නවවැනි සියවසේ පමණ සිට මෙරටට සංක්‍රමණය වූ ද විජය රජු හා ඔහුගේ පිරිසගෙන් සංකේතවන්නාවූ ද භාරතීය අර්ධ වෛදිකයන් ලෙස අප විසින් හඳුන්වනු ලබන්නාවූ ද ගෝත්‍රිකයන්ගේ සම්මිශ්‍රණයෙන් ඇති වූ ජාතියකි. ඒ අර්ථයෙන් ගත්කල සිංහලයන් ආදිවාසිකයන්, අඩුම තරමින් ආදිවාසිකයන්ගෙන් පැවත එන්නන්, නොවෙයැයි කීමේ හැකියාවක් නැත. භාරතයෙන් පැමිණි අර්ධ වෛදිකයන් යක්‍ෂ ගෝත්‍රිකයන් සමග සටන්කළ නමුත් ඉංගිරිසින් මෙන් ඒ පැරණි ගෝත්‍රිකයන් වඳකිරීමට කටයුතු කර ඇති බවක් නො පෙනෙයි. එමෙන් ම ක්‍රිස්තු පූර්ව නවවැනි සියවසේ පමණ මෙරට සිටි සියළු ගෝත්‍ර අර්ධ වෛදිකයන් හා මිශ්‍ර වීමට තීරණය නොකළ බව ද පැහැදිලි ය. එහි දී අඩු තරමින් ගෝත්‍ර දෙකක් කැපී පෙනෙයි. ඒ යක්‍ෂ හා ව්‍යාධ ගෝත්‍ර ය. යක්‍ෂ ගෝත්‍රිකයන් අඩුම තරමින් පණ්ඩුකාභය රජු දවස තෙක්, එනම් සියවස් පහක් හයක් පමණ අර්ධ වෛදිකයන් සමග සටන්කර ඇති බව පෙනී යයි. අවසානයේ දී චිත්‍රරාජ කාලවේල ආදී යක්‍ෂ නායකයෝ ද වාලවමුඛී වැනි යක්‍ෂ නායිකාවෝ ද පණ්ඩුකාභය කුමරු සමග සම්මුතියකට එළඹ අර්ධ වෛදිකයන්ගේ බලය අඩුකර සිංහල ජාතිය ගොඩනැගීමට කටයතුකර ඇති බව පැහැදිලි ය. (අද මෙරට ජාතිය ගොඩනැගීමට අර අඳින නිපුං වැනි බටහිර කටු ලෙවකන සංවිධානවල බත්බැලයන්ට මේ කරුණු නොපෙනෙන්නේ බටහිර කසිකබල් සමාජවිද්‍යාවන්හි මතවාදවලින් හා බටහිර මුදලින් ඔවුන්ගේ දෙනෙත් අඳ වී ඇති බැවිනි.) එසේ වුවත් මහාවංසය ලියන කාලයේ ද සිංහල ජාතියට අවශෝෂණය (අනුකලනය) නොවූ යම් යක්‍ෂ පිරිසක් මෙරට ජීවත් වී ඇත. එයට පෙර ගැමුණු කුමරු සමයේ ද ඒ පිරිස් ජීවත් වූ බවට මහාවංසය සාක්‍ෂි දරයි. මහාසෝණ වැනි යක්‍ෂ නායකයන් පසුව සිංහල වන්නට ඇතැයි සිතිය හැකි ය. කෙසේ වෙතත් එළාර සමග සටන්කිරීමට අනුරාධපුරයට යෑමට පෙර ගැමුණු කුමරු කතරගම මහසෙන් දෙවියන්ට භාරභාරවීමට ගිය පුවත මෙහි දී වැදගත් වෙයි. මහාවංසය යක්‍ෂයන්ට යම් විරෝධයක් දැක්වීමට හේතුව ද ඇතැම් යක්‍ෂයන් සිංහල ජාතියට අවශෝෂණය වීමට අකමැති වී දිගට ම සටන්කිරීම ය. යක්‍ෂයන්ට අමතරව සිංහල වීමට විරුද්ධ වූ තවත් ගෝත්‍රයක් විය. ඒ ව්‍යාධ හෙවත් වැදි ගෝත්‍රය ය. ඔවුන් යක්‍ෂයන් මෙන් අර්ධ වෛදිකයන් හා පසුව සිංහලයන් සමග කිවයුතු තරමේ සටන්කළ බවක් ද නො පෙනෙයි. එහෙත් ඔවුහු සිංහල නොවූහ. සිංහලයෝ ද වැද්දන් වෙනස්කිරීමට (ශිෂ්ටාචාර කිරීමට!) උත්සාහ නො කළහ. ඒ සිංහලයන්ගේ ශිෂ්ටාචාරකම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva